# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1279 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி |
| දිනය<br>Date | 10/10/2023<br>පැය 0730 | | |

**මාධ්‍ය නිවේදනය**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - කොටහේන පොලිස් වසම.

2023.10.09 වන දින රාත්‍රී කාලයේ කොටහේන පොලිස් වසමේ ශ්‍රී ගුණානන්ද මාවත ට්‍රාන්ස්පෝමරය අසලදී තියුණු ආයුධයකින් පහරදී බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදි මියගොස් ඇති බවට කොටහේන පොලීසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් පමණ වූ ශ්‍රී ගුණානන්ද මාවත, කොටහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම මව, පියා හා නැගණිය සමඟ ශ්‍රී ගුණානන්ද මාවත ප්‍රදේශයේ පදිංචිව සිට ඇත. එදින මරණකරුගේ මිතුරෙකු නිවසට පැමිණ ඇති අතර පසුව දෙදෙනාම ඉහත සඳහන් ට්‍රාන්ස්පෝමරය අසලට ගොස් සිටියදී තවත් පුද්ගලයෙකු සමඟ ජංගම දුරකතනයක් සම්බන්ධයෙන් ඇතිවූ ආරවුලක් දුරදිග යාමෙන් එම පුද්ගලයා විසින් මරණකරුගේ පපු ප්‍රදේශයට පිහියකින් ඇන ඇති බවට මෙතෙක් සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඝාතනය සිදුකල සැකකරු හඳුනාගෙන ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා කොටහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.

2023.10.10 වන අද දින අළුයම් කාලයේ කටුනායක පොලිස් වසමේ කෝවින්න ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරින්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 65 මිලිලීටර් 500 ක් හා ගෝඩා ලීටර් 567 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක්වූ ආඩිඅම්බලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**